24 ඒකකය - සරල රේඛීය තල රූප නිර්මාණය(1)

- **සරල රේඛා ඛණ්ඩයක් නිර්මාණය කිරීම**

අපි 3 cmක් දිග PQ සරල රේඛා ඛණ්ඩය නිර්මාණය කරමු.

පියවර 1 - කෝදුව භාවිතයෙන් සරල රේඛාවක් ඇඳ ගන්න. එය l ලෙස නම් කරන්න. l සරල රේඛාව මත ලක්ෂ්‍යයක් ලකුණු කර, එය P ලෙස නම් කරන්න.

පියවර 2 - කවකටුව, කෝදුව මත තබා කවකටුවේ තුඩ සහ පැන්සල් තුඩ අතර දුර 3 cmක් වන පරිදි කවකටුව සකසා ගන්න.



පියවර 3 - කවකටුවේ තුඩ සරල රේඛාවේ P ලක්ෂ්‍යය මත තබා 3 cmක දුරින් l රේඛාව මත ලක්ෂ්‍යයක් ලකුණු කරන්න. එය Q ලෙස නම් කරන්න.

පියවර 4 - P සහ Q ලක්ෂ්‍ය අතර 3 cm ලියා දක්වන්න.



- පහත දැක්වෙන දිග සහිත සරල රේඛා ඛණ්ඩ නිර්මාණය කරන්න.

i AB = 5 cm ii PQ = 8 cm iii XY = 3.5 cm iv PQ = 6.5 cm